# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

**දිනය** : 2014.04.30

**වේලාව** : පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 9. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

1. ගරු සභාපතිතුමන් විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

2014 අප්‍රේල් මාසය සඳහා වූ මහා සභාව සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවයේ කටයුතු වෙනුවෙන් ගරු සභාපතිතුමා සහ නගර සභා කාර්ය මණ්ඩලයට කාර්ය බහුලවූ බැවින් 2014 අප්‍රේල් මස 30 වන දිනට කල්දැමීමට සිදු වූ බැවින් ඒ පිළිබඳ ගරු සභාපතිතුමා විසින් සමාව අයැද සිටින ලදි.

මෙවර අලුත් අවුරුදු උත්සවය අප්‍රේල් මස 18 වන දින නගර සභා ක්‍රීඩා පිටියේ දී මෙම සභාව සමඟ බළන්ගොඩ පොලිසිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ සියලුම රාජ්‍ය ආයතන සහ ව්‍යාපාරික ප්‍රජාව එක්ව පැවැත්වූ බව ද, මේ සඳහා සිටි එෆ් එම් ආයතනය, දිනමිණ, සිළුමිණ,

සරසවිය සහ තරුණි පුවත්පත් මාධ්‍ය අනුග්‍රහය ලබා දුන් බව ද ගරු සභාපතිතුමන් දැනුම් දෙන ලදී. එසේම සිටි එෆ් එම් නාලිකාව මගින් සජීව සංගීත ප්‍රසංගයක් සංවිධානය කළ අතර ඒ සඳහා ප්‍රසිද්ධ ව්‍යාපාරික ධර්මදාස සිල්වා මැතිතුමා අනුග්‍රහය දැක්වූ බවද ලොව වටා ජනතාවට එම සංගීත ප්‍රසංගය සජීවීව රසවිඳීමට හැකිවූ බවද ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි. ඒ සඳහා සංවිධාන කටයුතු වලින් හා අනුග්‍රහය දැක්වූ සියළුම දෙනාට ස්තූතිය පල කරන බව ද, එසේම අවුරුදු උත්සවයේ අයවැය සම්බන්ධ පොතක් සකසන බවත් එය ඉදිරියේදී ලබා දෙන බවත් එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

එසේ ම නගර සභා කාර්ය මණ්ඩල නිලධාරීන්ට අවුරුදු උත්සවයට සහභාගි වීමට නොහැකිවීම හේතුවෙන් බළන්ගොඩ තානායමේදී ඔවුන් හා පවුලේ අය සඳහා අවුරුදු උත්සවයක් පැවැත්වූ බව ද එය සාර්ථක වූ බව ද ගරු සභාපතිතුමා දැනුම්දෙන ලදි. බළන්ගොඩ නගරයේ හා ලංකාව පුරා පැවැත්වූ සියළුම අවුරුදු උත්සව ජාති, ආගම් භේදයකින් තොරව පැවැත්වුණ බව ද ඒ සඳහා මාර්ගය විවර කළ ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට විශේෂයෙන් ස්තුති පලකරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

2013 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලද ටකරන් මඩු දෙක (හට් දෙක) සාදා ඇති බැවින් එය රැගෙන යන ලෙස ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදි.

අවුරුදු උත්සව හා වර්ෂාව නිසා ප්‍රමාද වූ සංවර්ධන කටයුතු නැවත ආරම්භ කර ඇති අතර ප්‍රදේශයේ ජනතාව බලාපොරොත්තු වන ඉලක්ක කරා හැකි ඉක්මනින් ගමන් කිරීමට ප්‍රදේශයේ සංවර්ධනය කඩිනම් කිරීමට අවශ්‍ය කටයුතු කරගෙන යන බවද ඒ සඳහා නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය බලාපොරොත්තු වන බව ද ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

එසේම මැයි පළවන දින ලෝක කම්කරු දිනය වන අතර කම්කරු නායකයෙකු වන අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා කම්කරු දිනය සාර්ථක කර ගැනීමට කටයුතු සංවිධානය කර ඇති අතර ඒ සඳහා සහභාගීත්වයෙන් සහයෝගය ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා ඉල්ලා සිටියේය.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය සභාවාරයේ මහා සභා වාර්තාවේ සමාලෝචන කිසියක් නොවීය.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

එහිදී අදහස් දක්වමින් ගරු සභාපතිතුමා විසින් අදාළ වර්ෂයේම කර්මාන්ත ප්‍රගතිය අවශ්‍ය නොවන බවත් අදාළ මාසයේ කර්මාන්ත ප්‍රගතිය පමණක් සභාවට ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් බවත් ඒ පිළිබඳ අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත් දැනුම් දුන්නේය. සුදර්ශන පුරගම මාර්ගය අළුත්වැඩියා කිරීම ද, වෙට්නෝල් පාර අළුත්වැඩියාව සඳහා අවශ්‍ය ගල් වැලි සූදානම්කර ඇති බව ද, දෙමළ විද්‍යාල මාර්ගය දෙපස කාණු පස් කපා ශුද්ධ කරන බව ද ආදී ලෙස ප්‍රගතිය දැක්වීම ප්‍රමාණවත් බවද ප්‍රකාශ කරන ලදි.

බෝම්බුව පාර පයිප්ප එළීම සඳහා JCB යන්ත්‍රයකින් කාණු දෙපස කපන බවද එම යන්ත්‍රය ඉතා විශාල බැවින් මගී ජනතාව දැඩි අපහසුතාවයකට පත්ව ඇති බවද කාණු කැපීම සඳහා කුඩා ස්කැවේටර් යන්ත්‍රයක් භාවිතා කිරීම සුදුසු බව ද, නගර සභා ගරු මන්ත්‍රී අසංක නිල්මිණී විජේසිංහ මහතා ප්‍රකාශ කරන ලදි. දැනටමත් එම කටයුතු අවසන් වෙමින් පවතින බැවින් ඉදිරි දින කිහිපය පමණක් මේ අපහසුතාවය විඳීමට සිදුවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේය.

කර්මාන්ත කමිටුවට සිටිගාර්ඩින් පාර අමතක වී ඇත්දැයි නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා සභාවෙන් විමසන ලදි. ඒ සඳහා ප්‍රතිචාර දැක්වූ ගරු සභාපතිතුමා පෙර දිනයේද එම මාර්ගය පරීක්ෂා කළ බවත් බළන්ගොඩ ප්‍රදේශයේ කොටස් වශයෙන් සංවර්ධනය කරන බැවින් ළඟදීම එම මාර්ගය ද අළුත්වැඩියා කරන බව දැනුම් දුන්නේය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 පළාත් පාලන ආයතන ලේකම්වරු සහ පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමාධාරීන් සඳහා සංවිධානය කරනු ලබන අධ්‍යාපන වැඩමුළුව

පළාත් පාලන ආයතන ලේකම්වරු සහ පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමාධාරීන් සඳහා 2014 ජූනි මස 1 සිට 06 දක්වා මැලේසියාවේ පැවැත්වීමට සංවිධානය කරනු ලබන අධ්‍යාපන වැඩමුළුව සඳහා මෙම නගර සභාවේ ලේකම් එම්. එච්. සීලවතී මහත්මිය තෝරාගෙන ඇති බව පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ ජාතික සම්බන්ධීකාරක විසින් දන්වා එවා ඇති බැවින්, ඒ සඳහා සභා අරමුදලින් රු. 125000.00 ගෙවීමටත්, අදාළ කාලසීමාව තුළ නිවාඩු අනුමත කිරීමටත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

### 06:02 පොදු වෙළඳසැල අංක 16 දරණ එළ හරක් මස් කඩය සඳහා තාවකාලික බලපත්‍ර ලබාගැනීම

2014 වර්ෂය සඳහා අංක 16 දරණ එළහරක් මස් කඩය සඳහා ස්ථිර බලපත්‍රයක් ලබාදෙන ලෙස විෂය භාර නිලධාරී කරන ලද ඉල්ලීමට අනුව ස්ථිර බලපත්‍රයක් ලබාදීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

එසේම 2014 වර්ෂය සඳහා අංක 16 දරණ එළහරක් මස් කඩය සඳහා ස්ථිර බලපත්‍රයක් ලබාදෙන ලෙස එම්. ආර්. එම්. රියාස් මහතා විසින් කරන ලද ඉල්ලීමට අදාළව ඉහත 06:02 වගන්තිය අනුව ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

### 06:03 C/57 දරණ කඩ කාමරය ලබාගැනීම - ජී. තිලංග ප්‍රනාන්දු මයා

බළන්ගොඩ මහජන පොළ, C/57 දරණ කඩ කාමරය අයිතිකරු වන ජී. කේ. ජී. එන්. පද්මකුමාර මහතා විදේශ ගත වන බැවින් එම කඩ කාමරය ඉදිරි කාලය සඳහා ලබා දෙන ලෙස තිලංග ප්‍රනාන්දු මහතා ඉල්ලීමක් කර තිබූ අතර සභාවට අය විය යුතු සියළු මුදල් අයකර ගෙන කුලී පදනම මත එය ලබාදීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 බළන්ගොඩ, කිරිඳිගල අංජන ෆාර්ම් නමින් පවත්වාගෙන යනු ලබන ඌරු කොටුව සම්බන්ධ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ පරීක්ෂණ වාර්තාව**

බළන්ගොඩ, කිරිඳිගල අංජන ෆාර්ම් නමින් ඇන්ටන් විතානාරච්චි යන අය විසින් පවත්වාගෙන යනු ලබන ඌරු කොටුව වෙනුවෙන් ලැබී තිබූ පැමිණිලි අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් පරීක්ෂා කර ඉදිරිපත් කරන ලද වාර්තාව දැන ගැනීම පිණිස ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

**06:05 බළන්ගොඩ, කිවුලේවෙල, ආනන්ද මෛත්‍රී මාවත බී. එස්. ලීලසේන මහතාගේ නිවස ආපදාවට ලක්වීම සම්බන්ධ කාර්මික නිලධාරීගේ පරීක්ෂණ වාර්තාව**

බළන්ගොඩ, කිවුලේවෙල, ආනන්ද මෛත්‍රී මාවත බී. එස්. ලීලසේන මහතාගේ නිවස ආපදාවට ලක්වීම සම්බන්ධ කාර්මික නිලධාරීගේ පරීක්ෂණ වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර සභා අරමුදලින් රු. 10000.00 ක මුදලක් ඒ මහතා වෙත ලබාදීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය. එසේම නිවස අසල ඇති උණගස් ඉවත් කිරීමට නියෝගයක් යවන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

**06:06 බළන්ගොඩ බස් නැවතුම් පළ ඒ 107 දරණ කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම**

බළන්ගොඩ, බස්නැවතුම් පොළ ඒ 107 දරණ කඩකාමරය බදු අයිතිය ඉවත් කිරීමට කර තිබූ ඉල්ලීම අනුව චක්‍ර ලේඛණය ප්‍රකාරව 25% ක කීමනී මුදල අය කර ගෙන බදු අයිතිය වෙනස් කිරීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:07 බළන්ගොඩ, කාර්පාර්ක් අංක 06 දරණ කඩ කාමරය නැවත පවරා ගැනීම - නුවන් දේශාන් ගුණතුංග**

බළන්ගොඩ, කාර්පාර්ක් අංක 06 දරණ කඩ කාමරය ටෙන්ඩර් ඉල්ලුම් කළ මුදලට පවත්වාගෙන යාමට නොහැකි බැවින් එය නැවත පවරා ගන්නා ලෙස නුවන් දේශාන් ගුණතුංග මහතා කර තිබූ ඉල්ලීමට අනුව පසුගිය මාසවල සියළුම හිඟ මුදල් අයකර, එය සභාවට පවරාගෙන නැවත ටෙන්ඩර් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:08 බුද්ධ ජයන්ති මාර්ගය පිළිසකර කර ගැනීම

බළන්ගොඩ, බුද්ධ ජයන්ති මාවතේ පෞද්ගලික ආයතනයක් විසින් ජල ව්‍යාපෘතියක් සඳහා ඉදිකිරීම් සිදුකරන බවත්, ඉතා මන්දගාමීව එම ඉදිකිරීම් සිදුවන බැවින් පාසල් දරුවන් හා මගී ජනතාව දැඩි දුෂ්කරතාවයට පත්ව ඇති බවට කර තිබූ පැමිණිල්ල ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එම ඉදිකිරීම් කඩිනම් කරන ලෙස දන්වා නියෝගයක් යැවීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

එසේම ඒ පිළිබඳ අදාළ ආයතනයට ලිඛිතව දැනුම් දෙන ලෙස වැඩ අධිකාරී මහතාට දන්වන ලදි.

### 06:09 වැලිහරනාව පාර යෝජිත ජල ටැංකි ව්‍යාපෘතිය සඳහා මාර්ගය පුළුල් කිරීම හේතුවෙන් කණ්ඩි කඩා වැටීම - තිලක් ප්‍රනාන්දු මහතා

කිරිදිගල, වැලිහරනාව පාර ඉදිකරනු ලබන යෝජිත ජල ටැංකි ව්‍යාපෘතිය සඳහා භාණ්ඩ ප්‍රවාහණයට මාර්ගය පුළුල් කිරීමේ දී තිලක් ප්‍රනාන්දු මහතාගේ ඉඩමේ බස් බෑවුමෙන් පස් කඩා ඉවත් කිරීමෙන් ඉදිරියේ දී නිවසට අලාභහානි සිදුවිය හැකි බවට තිලක් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, අදාළ ජල ව්‍යාපෘතියට මාර්ගය කඩිනමින් පිළිසකර කර දෙන දන්වා නියෝගයක් යැවීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

රු. 10000.00 ට වැඩි ගෙවීම් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

### 08:01 JCB යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා ලැබී ඇති වියදම් ඇස්තමේන්තුව

JCB යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා සෙනොක් ආයතනය වෙත ගෙනගොස් ඇති අතර එහි අළුත්වැඩිවා කටයුතු සඳහා රු. 2,485,709.52 ක ඇස්තමේන්තුවක් එවා ඇති අතර එතරම් මුදලක් සභාවෙන් වැය කළ නොහැකි බැවින් අත්‍යවශ්‍ය අළුත්වැඩියා කටයුතු පමණක් එම ආයතනයෙන් සිදුකර අනෙක් අළුත්වැඩියාවන් පළාත් යාන්ත්‍රික ඉංජිනේරු ඒකකය මගින් සිදු කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

08:02 සුබයිර් අලිම් මාවත දෙවන පටුමග සංවර්ධනය කිරීම

බළන්ගොඩ, සුබයිර් අලිම් මාවත, පළමු පටුමග කොටසක් කොන්ක්‍රීට් කිරීම සඳහා 2014-03-27 දින මහා සභාවේදී අනුමැතිය ලබාදී තිබූ අතර ඒ සඳහා වන රු. 271487.64 ක ඇස්තමේන්තුව සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ රු. 250,000.00ක මුදලක් ලබාදිය හැකි බවත් ඉතිරි රු. 21487.64 ක මුදල ශ්‍රම දායකත්වයෙන් සපයා ගන්නා ලෙසත් දැන්වූ අතර එම ඇස්තමේන්තුව අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදි. එසේම මෙම ඇස්තමේන්තුව රු. 250,000.00 කට අඩුකර නැවත සකස් කරන ලෙස තාක්ෂණික නිලධාරී මහතාට දැනුම් දෙන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

08:03 චෙට්නෝල් පාර තාර යොදා අළුත්වැඩියා කිරීම

බළන්ගොඩ, චෙට්නෝල් පාර තාර යොදා අළුත්වැඩියා කිරීම සඳහා 2014-03-27 දින මහා සභාවේදී අනුමැතිය ලබාදී තිබූ අතර ඒ සඳහා වන රු. 315500.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

09:01 මොහාන් සාලිය එල්ලාවල මාවත මධ්‍ය තීරය සඳහා විසිතුරු මල් පැළ මිලදී ගැනීම

බළන්ගොඩ, මොහාන් සාලිය එල්ලාවල මාවත මධ්‍ය තීරය සඳහා රෝපණය කිරීමට විසිතුරු මල් පැළ මිලදී ගැනීම සඳහා ලංසු පත් කැඳවන ලද අතර නාත්තණ්ඩිය, සඳලිය පැළ තවානේ මිල ගණන් අවම බැවින් හා පැළ සිටුවා දීම සමග එක් පැළයක මිල රු. 350.00 යටතේ පැළ 400 ක් ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

මෙවර මහා සභාවට යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි

## 11. යෝජනා

**11:01 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

11:01:01 දැනට අප සභාව මගින් පනවා ඇති අතුරු ව්‍යවස්ථා මොනවා ද? ඒවායේ සියළු පිටපත් ගරු සභාවට ඉදිරිපත් කළ ඉල්ලීම.

එම අතුරු ව්‍යවස්ථා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගෙන් ලබාගෙන ඉදිරි සභා වාරයේ දී ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

11:01:02 එක් ගමකට එක් වැඩක් යටතේ 2014 වර්ෂයේ කෙරෙන සංවර්ධන කටයුතු හා සභාව තුළ කෙරෙන සංවර්ධන යෝජනා වලට සභාවේ තලන යන්ත්‍රය (ගල් රෝල) ලබා දෙන ලෙසත්, එයට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලීම

එම යෝජනාවන් අනුව තලන යන්ත්‍රය (ගල් රෝල) දිනකට රු. 4000.00 ලබා දීම ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

11.02 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා

11.02.01 ළමා උද්‍යානය අසළ රථ ගාලක් සෑදීම

11.02.02 ළමා උද්‍යානය අසළ කුඩා ළමුන් සඳහා වැසිකිළියක් සකස් කිරීම

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, ඒ සම්බන්ධව පහත සඳහන් අදහස් ඉදිරිපත් විය.

***ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා***

*මේ සඳහා ලක්ෂ 20 ක ප්‍රතිපාදන වෙන් වී ඇති අතර නගර සභාවේ මුදල් නොමැති නිසා මන්ත්‍රී ප්‍රතිපාදන ලක්ෂ 2.5 සහ නගර සභාවෙන් තවත් ලක්ෂ 2.5 ක් ලබාගෙන මෙම වැසිකිළි පද්ධතිය සෑදීමට යොදාගන්නා ලෙස පවසන ලදි. නැතිනම් ඉදිරියේදී එය පළාත් නැගුම ව්‍යාපෘතියට මෙම යෝජනාව ඉදිරිපත් කර එයින් ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි. එසේම නගරය මැද ඉඩමක් ලබාදීම තුළින් සියළුම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබාදී ඇති බව ද ප්‍රකාශ කරන ලදි. එසේම මෙහි අවසාන පාලනය නගර සභාව සතුවිය යුතුය.*

***චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා***

*ගරු සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමාගේ ළමා උද්‍යානය නගරයට ඉතා වටිනාකමක් ලබා දෙනවා. එසේම පොදු වෙළඳසැල නවීකරණය වී අළුතින් ස්ථාපනය විය යුතුයි යන මතය මම දරනවා. එය අද තත්ත්වයට ගැළපෙන්නේ නෑ. එයට යටවී ප්‍රයෝජනයට නොගත් විශාල ඉඩම් ප්‍රමාණයක් තියෙනවා. ඒවායින් උපරිම ඵල නෙලාගැනීමට හැකිවන ආකාරයට කාර්පාර් එක හා වැසිකිළි පද්ධතිය සැකසීමේදී යෝජිත පොදුවෙළඳ සැලට ගැටළුවක් නොවන ආකාරයට සැලැස්මක් සකස් කර තිබෙන ඉඩමෙන් උපරිම ඵල නෙලා ගත හැකි ආකාරයට කටයුතු කරමු යැයි ඉල්ලා සිටිනවා.*

***ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා***

*නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමාගේ යෝජනාවට එකඟයි. නමුත් මහින්ද චින්තන සංකල්පය අනුව ජාතික ප්‍රතිපත්තියක් ලෙස එක් ගමකට එක් වැඩක් ව්‍යාපෘතිය තිබිය යුතුයි. බළන්ගොඩ කොට්ඨාශයේ පළාත් පාලන ආයතන 03 ක් ඇත. ඉඹුල්පේ හා බළන්ගොඩ ප්‍රාදේශීය සභා හා බළන්ගොඩ නගර සභාව ඒ ආයතන 03යි. එම ආයතන වලට අදාළ පොදු පහසුකම් ඔවුන් සපයා ගනියි. එම නිසා මෙය පමණක් බළන්ගොඩ ආසනයට මූලික විය යුතු නැත. මෙතුමා පවසන ආකාරයට මෙම ව්‍යාපෘතිය මූලික වන බවට මතයක් පැන නගියි. මෙය නගර සභාවේ පමණක් පොදු පහසුකම් සැපයීමේදී මූලික වියයුතු බව පවසනවා. එසේම යම් ඉදිකිරීමක් සිදුකරනවා නම් ප්‍රතිපාදන කෙසේ ලබාගත්තත් එම ඉදිකිරීම නගර සභා භූමියක සිදුකරයි නම් එහි ක්‍රමවේදය සලකා බැලිය යුතුය. එසේම මෙම ඉදිකිරීම් වලට අදාල සැලසුම සභාවට*

*ඉදිරිපත් කරන ලෙසද එයට අවශ්‍ය අනුමැතිය ඒ අනුව ලබාගත හැකි බවද කියයුතුය.*

***නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා***

*මෙම ව්‍යාපෘතිය සඳහා සතුට ප්‍රකාශ කරනවා. බළන්ගොඩ දීර්ඝ ඉතිහාසයට මෙවැනි දෙයක් නොපැවතුණා. මෙය නගරයට අත්‍යවශ්‍ය දෙයකි. වෙළඳ ප්‍රජාව හරහා විශාල මුදලක් ලබාගෙන කරගෙන යනවා. නමුත් උපසභාපති තුමා හා චමික මන්ත්‍රී තුමා පැවසූ ලෙස නිසි සැලැස්මකට අනුව මෙය ක්‍රියාකිරීම සුදුසු බව ද ඒ සඳහා සහයෝගය ලබාදෙනවා.*

***නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා***

*මෙය නවීන උපකරණ සහිත උද්‍යානයක් ලෙස සකසනවා. ඒ සඳහා ක්‍රීඩා උපකරණ විදේශයෙන් ආනයනය කරනවා. තනිකර මෙහි අයිතිය නගර සභාවට නොදී පාලක මණ්ඩලයකට ලබා දීමට යෝජනා කරනවා. ලංකාවේ අනෙක් උද්‍යාන ලෙස නොව මෙය පාලක මණ්ඩලයක් යටතේ පාලනය වීමේදී එහි නඩත්තුව නිසිලෙස සිදුවන නිසා අයිතිය නගර සභාව සතුකර පාලනය මණ්ඩලයකට පැවරීම සුදුසුයැයි දන්වා සිටිනවා.*

11:02:03 බළන්ගොඩ නගරයේ තිබූ සිනමාහල් දෙකෙන් එකක් හෝ නැවත විවෘත කිරීමට බලධාරීන් දැනුවත් කිරීම

අදාල බලධාරීන් වෙත ලිඛිතව දැනුම් දීමට යෝජනා වූ අතර එම යෝජනාවන් නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒවා මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

මෙවර කාරක සභා නොපැවති බැවින් වර්තා මහා සභාවට ඉදිරිපත් කර නොතිබුණි.

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

13:01 2014 මාර්තු මාසය සඳහා වන ලැබීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 4,531,929.93 |
| වෙනත් ලැබීම් | 3,911,134.69 |
| **මුළු ලැබීම්** | **8,443,064.62** |
| පුනරාවර්තන වියදම් | 6,528,199.02 |
| වෙනත් වියදම් | 10,032,089.12 |
| **මුළු වියදම්** | **16,560,288.14** |

ඉහත වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, පහත සඳහන් අදහස් ඒ සඳහා ඉදිරිපත් වුණි.

***ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා***

*ගලි බවුසරයේ ආදායම එක් වරම වැඩි වී ඇත. එසේම සභාවට රු. 160000 ක ආදායමක් ලැබී ඇත. නමුත් නොමිලේ සේවා ගැලපීමට පෙර ලාභයක් පෙන්නුම් කළත් නොමිලේ සේවා සැපයීමෙන් පසු රු. 394,608.00 ක ලාභයක් පෙන්වයි. එය සාමාන්‍යයෙන් බිල් කරන මුදල ගෙන ගැලපීම් කිරීමේ ක්‍රමය නිවැරදි නොවේ. එයට හේතුව කුමක්දැයි උපසභාපතිතුමන් විසින් විමසන ලදි. එසේම කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ විදුලි මීටරය පිළිබඳව ද එතුමා විමසීමක් කළේය.*

*එයට පිළිතුරු දුන් ගණකාධිකාරීතුමාන් ගැළපීම් වල පහසුව තකා මෙලෙස ගණනය කරන බවද නැතිනම් දුර ප්‍රමාණ අනුව ගැලපීම් සංකීර්ණ වන බව ද පෙන්වා දෙන ලදි.*

*විදුලි මීටරයට අකුණු සැර වැදීම නිසා ක්‍රියා විරහිත වී ඇති බැවි පැවසූ ගරු සභාපතිතුමන් විසින් එම මාසවල වාරිකය අනුව මෙවර දළ වශයෙන් උපකල්පනය කර විදුලි බිල එවා ඇති බව පෙන්වා දෙන ලදි.*

**13:02 2014.03.01 සිට 2014.03.31 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව**

2014.03.01 සිට 2014.03.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 517,670.60 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් මෙය ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු

**14:01 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

මෙම නගර සභාව මගින් ඇල්ලෙපොල ප්‍රදේශයේ නවීකරණය කරන ලද මාර්ග වල යම් යම් ස්ථාන පළුදු වෙමින් පවතින බැවින් දෙවන තාර වඩිය දැමීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටි අතර එම ව්‍යාපෘතිය සාර්ථක බව ප්‍රකාශ කරන ලදි. එසේම පල්ලෙකුඹුර මාර්ගය බැම්ම මේ වන විටද සාදන අතර එය බිම් මට්ටමට හෝ ඉදිකරන ලෙස ඉල්ලා සිටින ලදි.

එසේම සහෝදර ගරු මන්ත්‍රීතුමන්ලා වැරදි අවබෝධයකින් තමන් විපක්ෂයට ගියායැයි කරන කථා වෙනුවෙන් කණගාටුව ප්‍රකාශ කරන බව පැවසීය.

මාර්තු මස සභාවාරයේ පැවසූ පරිදි පසුගිය පළාත් පාලන මැතිවරණයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානය ජයග්‍රහණය කළ බැවින් තමන් මෙම සභාවේ සිටින බවත්, එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළේ නම් තමන් හට හෝ නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන්ට මෙම සභාව නියෝජනය කිරීමට නොහැකි වනු ඇති බවත්, නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් සඳහන් කළ අතර, මෙම සභාවේ සිටින එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලාට පෞද්ගලිකව විරුද්ධව නොව එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට විරුද්ධව තමන් කතා කරන බවත්,

තමන්ගේ අදහස ආණ්ඩු පක්ෂය ශක්තිමත් කිරීමට බවත්, විරුද්ධ පක්ෂය ශක්තිමත් වීම තුළින් ආණ්ඩු පක්ෂය පහලට බසින බවටත් පළ ප්‍රකාශය වෙනුවෙන් කණගාටුව පළ කළ නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් සෑම විටම ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමා විපක්ෂයේ වැඩවලට බාධාකරන බව ද නමුත් විපක්ෂය සුහදව ක්‍රියාකරන බවද පෙන්වා දෙන ලදි. එසේම ආණ්ඩු පක්ෂය තම කටයුතු සඳහා විරුද්ධ වන්නේ ජනතාවාදී වැඩ ලෙස තම කටයුතු ජනතාව දක්නා බැවින් යැයි ද ප්‍රකාශ කළේය. එසේම තමන් දේශපාලනය ව්‍යාපාරයක් කරගෙන නොමැති බවද එවැනි අවශ්‍යතාවයක් නොමැති බව ද පෙන්වා දෙන ලදි.

නමුත් ආණ්ඩු පක්ෂය සහයෝගය ඉල්ලා සිටින විට අවශ්‍ය කාරණා සම්බන්ධයෙන් පක්ෂ පාට නොබලා සහයෝගය ලබාදෙන බව ප්‍රකාශ කරන ලදි. එසේම එතුමා පෞද්ගලික අදහස් සභාවට ඉදිරිපත් කිරීම වෙනුවෙන් කණගාටුව ප්‍රකාශ කළේය.

පසුගිය දින ඇල්ලෙපොල පැවැත්වුණ අවුරුදු උත්සවය වෙනුවෙන් සහයෝගය දැක්වූ ගරු සභාපතිතුමා, උපසභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ට ප්‍රකාශ කරන ලදී.

**14:02 නගර සභා ගරු මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා**

ගිය වර සභා වාර්තාවේ එතුමාගේ කතාව ඇතුළත් වී නොමැති බව ප්‍රකාශ කළ අතර පුවත්පත් වල පළවී තිබුණද සභා වාර්තාවේ අන්තර්ගත වී නොමැති බව එතුමන් විසින් පෙන්වා දෙන ලදි.

එසේම JCB යන්ත්‍රයේ ආදායම සම්බන්ධයෙන් ගැටළුවක් ඇති බවත් ආදායම ලක්ෂ 08 ක් වන අතර වියදම ලක්ෂ 18 ක් වැයවී ඇති බවත් ආදායම ගැන සැලකිල්ලක් දැක්විය යුතු බවත්, මෙලෙස අක්‍රමිකතා වුවහොත් සභාව පහළ වැටීමට ඉඩ ඇති බැවින් තව දුරටත් මෙම යන්ත්‍රය සභාව තුළ තබාගන්නවාද නැද්ද යන තීරණය ඉක්මනින් ගත යුතු බව ගරු මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමන් ප්‍රකාශ කරන ලදි.

මහා සභාව වාර්තා කිරීමට පැමිණෙන මාධ්‍යවේදීන්ගේ සේවය ප්‍රසංසනීය බැවින් තම මන්ත්‍රී දීමනාව ඔවුන්ට පරිත්‍යාග කරන බවද ඉදිරියේ දී එය ලිඛිතව භාරදෙන බවද ප්‍රකාශ කරන ලදි.

මෙම අවස්ථාවේදී මාධ්‍යවේදී පියසේන මහතාට ඉහත කරුණ සම්බන්ධව ප්‍රකාශයක් කිරීමට ඉඩ ලබාදෙන ලෙස ඉල්ලා සිටි බැවින් ගරු සභාපතිතුමා මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කරන ලදි.

ගරු මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා මාධ්‍යවේදීන්ට තම දීමනාව ලබාදීම පිළිබඳ සතුට හා ස්තුතිය පළ කල මාධ්‍යවේදී පියසේන මහතා, නමුත් මාධ්‍යය යනු ගෞරවනීය මෙහෙවරක් බව ද නමුත් නගර සභාවෙන් ලබාදෙන දීමනාව දිරිමත් කිරීම සඳහා ලබා දෙන්නක් බැවින් එය ඉල්ලීමක් කර හෝ අරගල කර ලබාගැනීමට සදාචාරාත්මක අයිතියක් නොමැති බව ප්‍රකාශ කළේය. එසේම මෙම දීමනාව ලබාදීම සම්බන්ධයෙන් නැවත සිතා බලන ලෙස ඒ මහතා ගරු මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමාගෙන් ඉල්ලා සිටින ලදි. එසේම මෙය තමාගේ පෞද්ගලික අදහසක් බව ද ප්‍රකාශ කළේය.

නමුත් ගරු මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමන් ප්‍රකාශ කළේ දිරි දීමනාවක් ලෙස සහ සහයෝගයක් ලෙස තම දීමනාව පරිත්‍යාග කරන බවයි.

එසේම බෝම්බුව පාර ජලනල එළීමේදී පාසල් දරුවන් හා මගී ජනතාව දැඩි අපහසුතාවයට පත්වී ඇති බැවින් මාර්ග නඩත්තු කිරීමේදී කොන්ත්‍රාත් ලබාදෙන විට ඒ පිළිබඳ වැඩි අවධානයක් යොමු කළයුතු බවද එය සභාවේ වගකීමක් බව ද එතුමන් විසින් පෙන්වා දෙන ලදි.

**14:03 නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

මේ දිනවල අධික වර්ෂාපතනයක් පවතින අතර එම නිසා මාර්ග රැසක් දැඩි ලෙස අබලන් වී ඇති බවද නගර සභාවේ කම්කරුවන් ප්‍රමාණවත් නොවන බව දන්නේ නමුදු දෛනික සේවා පදනම මත හෝ කම්කරුවන් යොදවා ගෙන මාර්ග නඩත්තු කිරීම විධිමත් ව කරන ලෙස නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ඉල්ලා සිටින ලදි.

එසේම පාසල් ළමුන් දහස් ගණනක් ගමන් ගන්නා බුද්ධජයන්ති මාවත ජල ව්‍යාපෘතිය යටතේ කාණු කැපීමේදී ක්‍රමවත්ව කටයුතු සිදු නොවීමෙන් දැඩි අපහසුතාවයක් මතුවී ඇති බව ද වැලිහරනාව මාර්ගය ද මෙලෙස අක්‍රමවත්ව ජලනල එළීම නිසා ඉවුරු කඩා වැටීම සිදුවන බව ද පෙන්වා දුන්නේය. එබැවින් ජල සම්පාදන මණ්ඩලයට හා අදාළ කොන්ත්‍රාත් ගත් සමාගම දැනුවත් කර මගී ජනතාවට ගමන් කළ හැකි ලෙස මාර්ගය තාවකාලිකව හෝ සකස් කර ගැනීමට බලධාරීන් දැනුවත් කරන ලෙස එතුමන් විසින් ඉල්ලා සිටින ලදි. එසේම ජනතාවට සේවය කිරීම ප්‍රමුඛ වියයුතු බව ද එතුමන් විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

**14:04 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

නගර සභා ගරු මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමාගේ කතාව වාර්තාවට අන්තර්ගත නොවීම පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරන ලදි. එය එම සභාවාර්තාව සැකසූ දිනූෂ විතාරම මහතාට සිදු වූ ප්‍රමාද දෝෂයක් බව ද එම නිලධාරී මහතා ආයතනයෙන් ස්ථාන මාරුවක් ලබා ගොස් ඇති බව ද නමුත් ඒ මහතා නගර සභාව වෙනුවෙන් කළ කැපවීම ප්‍රසංසනීය වන අතර දක්ෂ බුද්ධිමත් නිලධාරියෙක් වන බැවින් හැකි ඉක්මනින් දිනූෂ විතාරම මහතා වෙනුවෙන් යම්කිසි උපහාරයක් පැවැත්වීම සුදුසු බව හා ඔහුගේ ඉදිරි අනාගතය සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරන බව ද ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදි.

එසේම මැයි මස 12 සිට 16 දක්වා විදේශගත වීමට සූදානම් බැවින් ඒ සඳහා නිවාඩු අනුමත කර දෙන ලෙස ගරු සභාපතිතුමාට දන්වන ලදි. ඒ සඳහා ලිපිලේඛන සූදානම් නමුත් නිවාඩු අනුමත කිරීමට සභාවට යොමු කළ යුතු බැවින් හා සභාවට ඇති ගරුත්වය නිසා මෙලෙස දැනුම් දෙන බවද ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ද එතුමන් විසින් දන්වන ලදි.

එසේම බුලත්ගම දෙමළ විද්‍යාලය මාර්ගය මේ දිනවල සකස් කරන බව ද ඒ සඳහා ස්තුතිය පළකරන බවද එතුමා ප්‍රකාශ කළේය. ලේඩි ස්මිත් වත්ත මාර්ගයේ නිසිලෙස ට්‍රැක්ටර් රථ ගමන් නොකිරීම නිසා එම ප්‍රදේශයේ ජනතාව අපහසුතාවයට පත්වී ඇති බැවින් ඒ පිළිබඳ මහජන සෞඛ්‍ය පරීක්ෂක දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින ලදි.

වැලිහරනාව ජල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඇති වූ මහත් ආන්දෝලනය නිසා ගරු සභාපතිතුමා හා ගරු මන්ත්‍රීවරු අපහසුතාවයට පත්වී ඇති බවත්, වැරදි මත ප්‍රකාශවීම, නිසා මෙලෙස සිදුව ඇති බවත් පෙන්වා දුන් එතුමා නගර සභා නිලධාරීන්ට එම ව්‍යාපෘති අධීක්ෂණය කිරීමේ අයිතිය ඇති බවත් නීත්‍යානුකූල අයිතිය ඇතිව කරන වැඩවලට වැරදිකරුවන් වී ඇති බැවින් ඒ පිළිබඳ ගරු උපසභාපතිතුමාගේ කණගාටුව ප්‍රකාශ කරන ලදි. මැණික් ගැරීම ජාවාරමක් ලෙස ක්‍රියාත්මක වන බැවින් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගනිමින් ඒ සඳහා කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදි.

පසුගිය සිංහල අවුරුද්ද ශ්‍රී ලංකාවේ සියළුම ස්ථාන වලදී ඉතා හොඳින් සමරන ලද බවද ලංකාවේ හොඳම පළාත් පාලන ආයතනය ලෙස බළන්ගොඩ නගර සභාව ද ඉතා ඉහළ මට්ටමෙන් ජාති ආගම් භේදයකින් තොරව අවුරුදු උත්සවය පැවැත්වූ බැවින් ඒ සඳහා කැපවුණ සියළුම පාර්ශවයන්ට ස්තුතිය පළ කරන ලදි.

තවත් වසරකින් මැතිවරණයක් පැවැත්වෙන බැවින් නගර සභාවෙන් ජය ගැනීමට ඇති අභියෝග හා ජනතාවගේ ගැටළු විසඳීමට ජනතා නියෝජිතයන් ඉදිරිපත් විය යුතු බව ද,

එසේම ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමාගේ ව්‍යාපෘතිය ඉතා සුදුසු බවට ද නමුත් ආයතන ක්‍රමවේද ඇති බැවින් ඒවා අනුගමනය කල යුතු බවද හෙට දින එනම් මැයි මස 01 වන දින පැවැත්වෙන ලෝක කම්කරු දිනයට කම්කරු නායක අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට සහයෝගය ලබා දීමට සියළු මන්ත්‍රීවරු සමග සූදානම් බව ද ලක්ෂ 13 කට අධික රජයේ සේවකයන්ට රැකියා ලබාදුන් විශාල වශයෙන් සංවර්ධන කටයුතු කළ එම ජනනායකයා ශක්තිමත් කිරීමට සහයෝගය ලබාදෙන බවද ප්‍රකාශ කරන ලදි.

**14:05 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

කුඩා දරුවන්ට විනෝද වීම සඳහා සාදන ලද ළමා උද්‍යානයට ලක්ෂ 20 ක ප්‍රතිපාදන වෙන් වී ඇතත්, ඒ අසල රථ ගාලක් සෑදීම හා ළමා උද්‍යානය අසළ කුඩා ළමුන් සඳහා වැසිකිළියක් සකස් කිරීම සඳහා ගරු සභාවෙන් අනුමැතිය ලබා දෙන ලෙස නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ඉල්ලා සිටින ලදි. එසේම එක් ගමකට එක් වැඩක් යනුවෙන් වැරදි අර්ථකථනයක් යන බව ද මෙය එක් ගමකට එක් වැඩක් නොව බළන්ගොඩ ආසනයටම එක්වැඩක් ලෙස මෙය දකින ලෙසට ද තමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් වැසිකිළි සෑදීම සඳහා මුදල් ලබානොගෙන නගර සභා වියදමින් එය සකසා දෙන ලෙසද, එසේම අනෙක් සියළු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය හා ප්‍රතිපාදන හැකිනම් ඒ සඳහා ලබාදිය යුතු බව ද පවසන ලදි. එසේම ජූනි මාසය වන විට එය විවෘත කිරීමට කටයුතු යොදන බවද එතුමා ප්‍රකාශ කළේය.

**14:06 නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා**

විපක්ෂ නායක අසංක නිල්මිණී විජේසිංහ මැතිතුමා තම සම්පූර්ණ වැටුප මාධ්‍යවේදීන් සඳහා වෙන්කිරීම සම්බන්ධයෙන් තම ස්තුතිය පළ කරන බවද, මාධ්‍යවේදීන් යනු සභාවෙන් සිදුවන සංවර්ධන කටයුතු හා මන්ත්‍රීවරුන්ගේ හැසිරීම්, අදහස්, ප්‍රතිචාර ජනතාව වෙත ලෝකය වෙත ලබාදෙන පිරිසක් බැවින් බළන්ගොඩ කුණු ගොඩක් යැයි ප්‍රචලිත නාමය අද සුන්දර බළන්ගොඩ යනුවෙන් වෙනස් කළේ ඔවුන් බව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් ප්‍රකාශ කරන ලදි.

බළන්ගොඩ ජනතාව ආගම්, ජාති, කුල භේදයකින් තොරව සහෝදරත්වයෙන් ජීවත් වන බව ද නගර සභාව මූලික කරගෙන පැවති අවුරුදු උත්සවය ඒ සඳහා උදාහරණයක් වන බව ද ඒ සඳහා සිංහල, දෙමළ, මුස්ලිම් වෙළඳ ව්‍යාපාරික ප්‍රජාව දුන් සහයෝගය ඉතා ප්‍රසංසනීය බවද ඒ නිසා අවුරුදු උත්සවය සාර්ථක වූ බවද පෙන්වා දෙන ලදි. එසේම සිටි FM සේවය අනුග්‍රහයෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නිල නිවසේ පැවැත්වූ අවුරුදු උත්සවයට සමගාමීව ගරු අමාත්‍ය භාණු මුණිප්‍රිය මැතිතුමාගේ නිවසේ පැවති අවුරුදු උත්සවයට මුස්ලිම් හා දෙමළ ජනතාව ද සහභාගී වූ බවද එතුළින් ජාතික සමගිය පෙන්වූ බව ද එතුමන් විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

එසේම අද දේශපාලනයේ හතුරන් හෝ මිතුරන් නොමැති බවත්, ගරු මන්ත්‍රී චමික වැවේගෙදර මැතිතුමා සමග පෞද්ගලික තරහක් නොමැති බවත්, 99.9% ක් මුස්ලිම් ජනතාවට සේවය කළ ද ඔවුන් තමන්ට ඡන්දය නොදෙන බව ගරු මන්ත්‍රී මලීක්ෂා මැතිතුමා ප්‍රකාශ කළ බවද නමුත් තමන් සෑම අවස්ථාවක ම ජනතාවට සේවය කර බුද්ධියෙන් වැඩකටයුතු කර මෙතැනට පැමිණ ඇති බව පෙන්වා දෙන ලදි. නමුත් දේශපාලන භේදයක් නොමැතිව වාද විවාද කොතරම් පැවතුණත් සහෝදරත්වය සැමදා පවතින බවද, අවසානයේ සංවර්ධන කටයුතු කර ජනතාවට සේවය කළ යුතු බව එතුමන් විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

## 15. අවසානය

**ගරු සභාපති එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

බළන්ගොඩට අවශ්‍ය සිනමා ශාලාව පිළිබඳ යෝජනාව කෙරෙහි ක්ෂණිකව ක්‍රියාත්මක විය යුතු හා නැවත එය විවෘත කරගත යුතු බව ද වසර ගණනාවක් උත්සාහ කරන ලද ජල ව්‍යාපෘතිය වෙනත්

අංශ කෙරෙහි යොමුවී ඇති බැවින් ඒ පිළිබඳ ජලාප්‍රවාහන ඇමතිවරයා දැනුවත් කර ජනතාව විඳින පීඩා අවම කිරීමට ක්‍රියාකරන බව ප්‍රකාශ කරන ලදි. එසේම මැයි පළමුවන දින පැවැත්වෙන ලෝක කම්කරු දිනය සාර්ථක කර ගැනීම සඳහා කම්කරු නායකයෙක් වන අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට දැක්විය හැකි සියළු සහයෝගය දක්වන බවට ද ඉදිරියේදී ජනතාව බලාපොරොත්තු වන සංවර්ධනය ජනතාවට ලබාදීමට උපරිම කැපවීමෙන් කටයුතු කරන බවද ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ කටයුතු ප. ව. 2.00ට අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,

සභාපති,

බළන්ගොඩ නගර සභාව.